
KIDS GOD WORSHIP
www.kidworship.kr

# යහපත් සමාරිතයා

-The Good Samaritan-



48Page

**පොතේ ගුරා** විනයධරයෙක් නැගිට යේසුස්වහන්සේව පරික්ෂා කරන පිණිස හිට ගත්තා.

**විනයධරයා** සදාකාල ජීවනය ලබාගන්න පිණිස මම මොනවද කරන්න ඕන ?

**යේසුස්වහන්සේ** ව්‍යවස්ථාවේ ලියා තිබෙන්නේ මොකක්ද?

**විනයධරයා** නුඹේ මුලු හෘදයෙන්ද, නුඹේ මුලු ආත්මයෙන්ද, නුඹේ මුලු බුද්ධියෙන්ද, නුඹේ මුලු ශක්තියෙන්ද නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේමකරන්න සහ නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේම කරන්න කියා...

**යේසුස්වහන්සේ** ඔබ හරියටම උත්තර දුන්නා, ඔබ ඒක කරන්න, එවිට ඔබට සදාකාල ජීවනය ලැබෙනවා.

**පොතේ ගුරා** ඒත් විනයධරයා තමාවම නිදොස් බව පෙන්වීමට මෙහෙම ඇහුවා...

**විනයධරයා** එහෙමනම් මගේ අසල්වාසියා කවුද?

**පොතේ ගුරා** එයට පිළිතුරු දෙන පිණිස යේසුස්වහන්සේ විසින් කතන්දරයක් කියනු ලැබුවා.

.........................................................................................



49Page

**යේසුස්වහන්සේ** දිනක් මිනිසෙක් ජෙරුසලමේ සිට ජෙරුකෝවට යද්දී සොරුන්ගේ අත්වලට හසු වුණා.

**පළමු හොරා** හේ... !මට ඔයාගේ ඇඳුම් සහ සල්ලි ඔක්කොම මෙහෙට දෙන්න! මම දැන් මේ ඔක්කොම ගන්නවා. දැන් මේ සියල්ලම මගේ...

**මිනිසා** අනේ එපා ! කරුණාකරලා ... ඒවා මට ආපහු දෙන්න !!

**දෙවන හොරා** මිම් මම හිතන්නේ මෙයාට අමාරු පාඩමක් උගන්වන්න ඕන.. ඩිහ්ඩිහ්ඩිහ් (අනිනවා - ගුටි දෙයි)

**මිනිසා** (ගුටිකෑම නිසා) උග්ගු... ආහ්ච්... අම්මෝ... ඕහ්හ් හ් ම්...

**යේසුස්වහන්සේ** හොරුන් මේ මිනිසාගේ ඇඳුම් ගළවලා, එයාට හොඳටම ගුටි දීලා, තලලා, එයාව බාගෙට මරලා වගේ දානවා.

.........................................................................................



50Page

**යේසුස්වහන්සේ** ඒ මිනිසා කොපමණ තුවාල වුණාද කිවොත් ඔහුට නැගිට ගන්නවත් බැරි-වුණා. හොඳටම අඩපණව සිටියා. එතකොටම කවුරුහරි ඇවිදගෙන එන අඩි ශබ්ද ඔහුට ඇහෙන්න ගත්තා. ඒ දෙවියන්වහන්සේගේ මාලිගාවේ පූජාවන් ඔප්පු කරන පූජකයෙක්ගේ අඩි ශබ්දය යි.

**මිනිසා** (සිත තුළ සිතමින්) ආහ්ම්... ඇති යාන්තං පූජකයෙක් ! අනිවාර්යයෙන්ම එයා මට උදව් කරයි !! ඔහ්හ් ආච්ච්ච්... කරුණාකරලා මාව ගළවගන්න-කෝ ! ඔහ්හ් ආච්ච්ච්... කරුණාකරලා මට උදව් කරන්නකෝ !

**යේසුස්වහන්සේ** ඒත් පූජකයා මේ වැටී සිටින මිනිසා දැක, ඔහු පසුකර අනිත් පැත්තෙන් යන්නට ගියා.

.........................................................................................



51Page

**යේසුස්වහන්සේ** ටික වෙලාවකට පසුව, තවත් අඩි ශබ්දයක් ඇසෙනවා. ඒ දේව මාලිගාවේ පූජකයන්ට උදව්කරන ලෙවීවරයෙක්ගේ අඩි ශබ්දයයි.

**මිනිසා** (සිත තුළ සිතමින්) ඔහ්හ් ආව්ච්ච්... ආහ්ම්... ලෙවීවරයෙක්, අනිවාර්යයෙන්ම මෙය නම් මට උදව් කරයි. කරුණාකරලා... කරුණාකරලා... මාව බේරගන්නකෝ...

**යේසුස්වහන්සේ** ඒ ලෙවීවරයාත් මේ වැටී සිටින මිනිසා දැක, ඔහු පසුකර අනෙක් පැත්තෙන් යන්නට ගියා.

**යේසුස්වහන්සේ** මේ වැටී සිටිය මිනිසා එන්න එන්නම ක්‍රමක්‍රමයෙන් දුර්වල තත්වයට පත්වීගෙන යනවා. ටිකවෙලාවක් යත්ම තවත් අඩි ශබ්දයක් ඇහුණා. මිනිසෙක්. බූරුවෙක් පිට අසුන්ගෙන යනවා. ඔහු සමාරිතයෙක්. ඉශ්රායෙල්වරුන් සමාරිතයන්ව ගණන් ගත්තේ නෑ. ඉශ්රායෙල්වරුන් විසින් ඔවුන්ව පහත් කර සැලකුවා.



52Page

**මිනිසා** (සිතමින්) පූජකයාත්, ලෙවීවරයාත් මට උදව්කරන්න නතර වුණේ නෑ.. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ සමාරිතයාත් මාව පසුකරගෙන අනිත් පැත්තෙන් ඇවිදගෙන යයි. ආහ් ආාාව්... එන්න එන්නම මගේ ශක්තිය අඩුවෙලා යනවා. මට හිතෙන්නේ මගේ අන්තිමය, මගේ මරණය මා කරා එනවා වගේ ...



53Page

**යේසුස්වහන්සේ** ඒ මිනිසා ගොඩක් අඩපණව, දුර්වලව සිටියා. ඔහු තව උත්සාහයක්වත් ගැනීමෙන් දුර්වලව සිටියා. මෙහෙම ඉද්දී පුදුම දෙයක් සිද්ධවුණා. අර සමාරිතයා බූරුවාගේ පිටින් බැස ඔහුට උදව්කරන්න පැමිණෙනවා.

**සමාරිතයා** ඔහ්... හිතවත... ඔයාගේ ලේ ගොඩාක් ගිහින් නේද? මේ පලාතේ ගොඩක් සොරුන් ඉන්නවා. ඒ නිසා ඔයා පරිස්සම්වෙන්න ඕනේ...

**යේසුස්වහන්සේ** සමාරිතයා පළමුවෙන්ම මේ මිනිසාගේ ලේ පිසදමා, ඉන්පසුව ඔහුගේ තුවාලවලට බෙහෙත් දමා, පිරිසිදුකොට ප්‍රවේශමෙන් වෙලුම්පටිවලින් තුවාල බැන්දා.

.............................................................................................................



54Page

**යේසුස්වහන්සේ** මේ සමාරිතයා ඔහුගේම බූරුවාගේ පිට මේ මිනිසා හිඳුවාගෙන තානායමකට ගෙනගොස් බලාගත්තා. පසුවදා මුදල් රැගෙන තානායම්කරුට දී මෙහෙම කීවා.

**සමාරිතයා** මට දැන් යන්න ඕන. ඒ වුණත් කරුණාකර මොහුව හොඳින් බලාගන්න. මම නැවතත් එනවා. මම ඇවිත්, මොහු වෙනුවෙන් ඔබට වැඩිපුර වියදම් වූ සියල්ල මම ගෙවන්නම්.

**පොතේ ගුරා** මේ කතන්දරය කියා නිම වූ පසුව, යේසුස්වහන්සේ පරීක්ෂා කරන්නට පැමිණි විනයධරයාගෙන් උන්වහන්සේ මෙහෙම ප්‍රශ්ණයක් ඇසුවා.

**යේසුස්වහන්සේ** මේ කතාවේ පුද්ගලයන් තුන්දෙනෙක් ඉන්නවා. පූජකයෙක්, ලෙවියෙක් සහ සමාරිතයෙක්. මේ සොරුන්ට අසුවූ පුද්ගලයාට මේ තුන්දෙනාගෙන් සැබෑ අසල්වාසියා වුණේ කවුද?

**විනයධරයා** ඒ මිනිසාට කරුණාව දක්වා, එයාට උපස්ථාන කළ කෙනා / සමාරිතයා.
යේසුස්වහන්සේ - ඒක හරි. දැන් ඔබත් ගිහින් එයම කරන්න.

| | |
|---|---|
| **පොතේගුරා** | **යේසුස්වහන්සේ කී වචනය විනයධරයාට තදින්ම කාවැදුනා. ඔහු තමාගේම සිත තුළ සිතාගෙන යන්න ගියා.** |
| **ජීවිතයට අදාල කිරීම** | **දුවේ පුතේ, ඔයා දෙවියන්වහන්සේට ආදරෙයිද? ඔව්! ඔයා අසල්ව-ාසීන්ටත් ආදරෙයිද? ඔව්! එහෙනම් ඔයාගේ වටේ සිටින අය දිහා හොඳින් බලන්න. ඔයා අද දවසේ උදව් ඕන අයට උදව් කරන්න සූදානම් වෙන්න.** |